www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද මහබැංකු සභාපති බර්නන්කේ කොන්ග්‍රසය ඉදිරියේ කරුනු දැක්වීමෙන් පසුව කොටස් මිල කඩාවැටෙයි

## US stocks plunge following Fed Chairman Bernanke's testimony before Congress

**බැරී ග්‍රේ විසිනි**
**2008 මාර්තු 1**

ෆෙඩරල් රිසර්ව් මන්ඩල සභාපති බෙන් බර්නන්කේ කොන්ග්‍රසය හමුවේ සාක්ෂි දීමෙන් පසුව, පෙබරවාරි 28 හා 29 දිනවල එක්සත් ජනපද කොටස් වෙලඳපොලවල මිලගනන් තියුනු ලෙස පහත වැටුනි.

ඩව්ජෝන් කාර්මික මිල දර්ශකය 28 වන දින ඒකක 112 කින් (සියයට 0.9 ) ද, 29 වන දින ඒකක 315 කින් (සියයට 2.5 ) ද පහත වැටුනු අතර ඊට පෙර දින හතරේ වැඩිවූ අගය අතුගා දමමින් කොටස් මිල දර්ශකයේ පාඩුව අඛන්ඩව සිව්වෙනි මාසයට ද ඉතිරි කලේය.

පෙබරවාරි 29 වන දින අනෙකුත් ප්‍රධාන කොටස් මිල දර්ශකයන් ද තියුනු ලෙස පහත වැටුනි. ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (එස් ඇන්ඩ් පී) 500 දර්ශකය ඒකක 37 කින් (සියයට 2.7 ) ද, නැස්ඩැක් සංයුක්ත දර්ශකය ඒකක 60 කින් (සියයට 2.6 ) ද, පහල ගියේ ය. එදින අවසානයේ එස් ඇන්ඩ් පී 500 දර්ශකය 1941 න් පසු නව වසරක නරකම ආරම්භයට මුහුන පෑවේය.

පෙබරවාරි 27 වන දින බර්නන්කේ, මහජන නියෝජිත මන්ඩලයේ මූල්‍ය නියෝජිත කමිටුව හමුවේත්, 28 වන දින සෙනෙට් බැංකු කමිටුව හමුවේත් පෙනී සිටියේ, කොන්ග්‍රසයට ෆෙඩරල් රිසර්ව් මන්ඩලයේ අර්ධ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා ය. එක්සත් ජනපදයට තවමත් අවපාතයක් වලක්වාගතහැකි බව විශ්වාස කරන ලෙස කියා සිටින අතර ම, නිවාස වෙලඳපොලේ බිඳ වැටීම, නය හා බැංකු අර්බුදය, පාරිභෝගික වියදම් මන්දගාමී වීම, වැඩෙන විරැකියාව හා බිංදුවට ම බැස ඇති ආර්ථික වර්ධනය, සමඟ බද්ධ වුනු වැඩිවන උද්ධමනය හා දුබල වන ඩොලරය නිසා වැනෙමින් ඇති ආර්ථිකයක ගොරහැඩි චිත්‍රයක් ඔහු ඉදිරිපත් කලේය.

මාර්තු 18 වන දින බැංකුවේ ප්‍රතිපත්ති තීරක මන්ඩලය වන ෆෙඩරල් විවෘත වෙලඳ කමිටුව නැවත හමුවන විට යලිත් පොලී අනුපාතය කපාහැරීමට අදහස් කර ඇති බව බර්නන්කේ පැහැදිලි කලේය. පසුගිය සැප්තැම්බරයේ සිට පොලී අනුපාතය කපාහැරීමට යන හය වන අවස්ථාව වන මෙවර, ෆෙඩරල් අරමුදල් අනුපාතය තවත් ඒකක 0.5 කින් හෝ සමහරවිට 0.75 කින් පහත දැමීමට බැංකුව අදහස් කරයි. මෙවර ඒකක 0.5 කින් කෙටිකාලීන ප්‍රමිති අනුපාතය පහත දැමුව හොත්, එක්සත් ජනපද අවමුඛ උකස්කර වෙලඳපොල බිඳවැටී, එරට මෙන්ම ලෝකයේ වැඩිහරියක නය වෙලඳපොලවල් කැටි ගැසුනු පසුගිය අගෝස්තුවේ එය පැවති සියයට 5.25 මට්ටමේ සිට සියයට 2.5 දක්වා පහත දැමීමක් වනු ඇත.

මූල්‍ය වෙලඳපොලවලට ද්‍රවශීලතාවය ගලා ඒම සඳහා පොලි අනුපාතික පහල දැමීම සඳහා ද, බිලියන ගනන් අවමුඛ උකස්කරයන්ගේ අලාභයන්ට මුහුනපා සිටින බැංකුවලට පිහිට වීම සඳහා ද, වෝල්වීදියේ බැංකු හා මූල්‍යායතන කල බලපෑම් හමුවේ පොලී අනුපාතිකයන් පිලිබඳව බර්නන්කේගේ ඇඟවීම් තිබිය ද, ඔහුගේ සාක්ෂියෙහි අඳුරු යථාර්ථය, වාර්තාගත ඉහල බොර තෙල් මිල ගනන් හා බැඳුනු නව අවධමනාත්මක ඇඟවුම්, තොග විකුනා දැමීමට පොහොර දැමීය.

නියෝජිත සභාවට ඔහු කල ආරම්භක ප්‍රකාශයන්හි දී බර්නන්කේ, ජූලි මාසයේ දී ඔහු කොන්ග්‍රසයට ඉදිරිපත් කල වාර්තාවන්ට වෙනස් ආකාරයෙන් කියාසිටියේ, ආර්ථික තත්වය "පැහැදිලිව ම අවාසිදායකව" ඇති බවය. ඉන්පසුව ඔහු මූල්‍ය වෙලඳපොලවල අඛන්ඩව පවත්නා "ආතතීන්" ගැන ද, "බොහෝ ගෘහයන්ගේ හා ව්‍යාපාරයන්ගේ නය හිරවීමට" තුඩුදුන් නය වෙලඳපොලවල කලබැගෑනිය, ආර්ථික වර්ධනයේ තියුනු හැකිලීම, රැකියා සැපයුම මන්දගාමී වීම හා විරැකියාවේ නැගීම ගැන සඳහන් කලේ ය.

නිවාස වෙලඳපොලේ බිඳ වැටීම අඩුම තරමින් තවත් වසරක් යන තෙක් ආර්ථිකයට බරක් ව පවතිනු ඇතැයි ද, 2007 වසරේ පටන් පාරිභෝගික වියදම් හීන වී ඇතැයි ද ඔහු ඇඟවුම් කලේය. 2008 වසරේ මුල් භාගයෙහි ව්‍යාපාර ආයෝජන දුබල වනු ඇතැයි ද, නිවාස ක්ෂේත්‍රයෙන් පිට ඉදිකිරීම් "තියුනු ලෙස පහත වැටෙනු" ඇතැයි ද, අනාවැකි පල කලේය.

මෙම වසරේ සිව්වැනි කාර්තුව වනවිට විරැකියා අනුපාතය සියයට 4.9 ක් වන වත්මන් මට්ටමේ සිට සියයට 5.2 ක් හෝ 5.3 ක් දක්වා නැඟෙනු ඇති බවට ඔහු ප්‍රක්ෂේපනය කලේය.

සැබෑ යථාර්තය ඔහුගේ ප්‍රක්ෂේපනයන්ට වඩා නරක අතට හැරීමට ඉඩ ඇති බවට ඔහු අනතුරු ඇඟවීය. මෙහිදී ඔහු පෙන්වා දුන්නේ, නිවාස වෙලඳපොල හෝ ශ්‍රම පෙලඳපොල වඩාත් නාටකාකාර ලෙස පිරිහීමට ඇති හැකියාව හා එමගින් නය අර්බුදය ඔද්දල් විය හැකි බවයි.

වැඩෙන උද්ධමනය ද ඉන්ධන හා පාරිභෝගික භාන්ඩ මිල ගනන් පිම්මේ ඉහල යාම ගැන සැලකිලිමත් වෙමින් ඔහු කියාසිටියේ, බැංකුව "උද්ධමනය හා උද්ධමනකාරී බලපෑම් සමීපව නිරීක්ෂනය කරන" බවයි. එහෙත් ඔහු නිශ්චිතව අවධානය යොමු කලේ අවධමනයේ අන්තරාය කෙරෙහි ය. ඔහු මෙසේ පැවසීය. "වර්ධනයට සහාය වන හා රිනාත්මක අන්තරායන්ට මුහුන දීම සඳහා ප්‍රමානවත් රැකවරන සැපයීමට අවශ්‍ය පරිදි කාලානුරූප ලෙස බැංකුව කටයුතු කරනු ඇත." මෙය බැංකුව තවදුරටත් පොලී අනුපාතික කපාහැරීමට සූදානම් බව වක්‍රෝත්තියෙන් කීමකි.

ඉන් පසු දින සෙනේට් බැංකු කමිටුව ඉදිරියේ පෙනීසිටි බර්නන්කේ කියාසිටියේ, 2001 වසරේ ඩොට්කොම් කොටස් වෙලඳපොලේ කඩාවැටීමෙන් පසු භාගයේ එක්සත් ජනපද ආර්ථිකය මුහුන දුන්නාට වඩා මෙය දුෂ්කර තත්වයක් බවයි. එවකට එක්සත් ජනපදය ආර්ථික අතිරික්තයක් පවත්වා ගත් අතර ඩොලරය ශක්තිමත් තැනක හා උද්ධමනය පහත මට්ටමක පැවතුනු බවත්, 2001 දී බොරතෙල් බැරලයක්, අද දින ඩොලර් 100 ට සාපේක්ෂව අලෙවි කලේ ඩොලර් 20 කට බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.

අද දින මධ්‍යම ආන්ඩුව දැවැන්ත අය වැය හිඟයක් පවත්වාගෙන යන අතර ඩොලරය දුබලව හා එන්ට එන්ටම දුබල වෙමින් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස "කොන්ග්‍රසයට හා මධ්‍යම බැංකුවට ආර්ථික බෙලහීනතාවයට එරෙහිව සටන් කිරීමේදී ඇත්තේ අඩු නිදහසක්" බව ඔහු පැවසීය.

එක්සත් ජනපදයේ මෙන්ම ජාත්‍යන්තර වෙලඳපොලවල ප්‍රතිරාවය නංවන කාරනයක් ද ඔහු එකතු කලේය. එනම් "බැංකුවල යම් අසාර්ථකත්වයක හැකියාවක් පවතියි." ප්‍රධාන බැංකු කිසිවක් බිඳ නොවැටෙනු ඇති බවට විශ්වාසයක් තමා තුල ඇතැයි ද එහෙත් සමහර කුඩා බැංකු අසාර්ථක වීම නොවැලැක්විය හැකි වෙතැයි ද ඔහු කියා සිටියේය.

බර්නන්කේගේ කරුනු දැක්වීම ගෝලීය මූල්‍ය හා භාන්ඩ වෙලඳපොලවල ක්ෂනික ප්‍රතික්‍රියා දැනවීය. එක්සත් ජනපද පොලී අනුපාතයන් කපාහැරීම පිලිබඳ පොරොන්දුව මෙන්ම ආර්ථික තත්වය පිලිබඳ ඔහුගේ අඳුරු තක්සේරුව ඩොලරය තියුනු ලෙස පහත හෙලීය. 28 වන දින යුරෝවට සාපේක්ෂව ඩොලරය 1.52 ක් සලකුනු කරමින් වාර්තාගත පහත මට්ටමකට ඇදවැටුනි. එය ස්විස් ප්‍රැන්ක් මුදලට සාපේක්ෂව ද වාර්තාගත පහලකට වැටුනු අතර ජපාන යෙන් මුදලට අනුව තෙවසරකට පසු පහතම අගය ද සලකුනු කලේය.

පසුගිය සය වසර මුලුල්ලේ ඩොලරය යුරෝවට සාපේක්ෂව සියයට 40 කින් ද, ප්‍රධාන මුදල් ගොන්නට අනුව සියයට 20 කින් ද පහත වැටී තිබේ. මෙම සතියේ ඇතිවූ වැටීමත් සමඟ එය, 1973 දී එක්සත් ජනපදය ඩොලරය නිදහසේ පාවීමට ඉඩ හැරීමෙන් පසුව එහි පහතම මට්ටමට ඇද වැටුනි.

පෙබරවාරි 28 වන දින ඩොලරයේ ගිලාබැසීම, නිව්යෝර්ක් වෙලඳ හුවමාරුවේ බැරලය ඩොලර් 102.59 ක වාර්තාගත ඉහල අගයක් සලකුනු කරමින් ඩොලර් වලින් මිල නියම කරන බොර තෙල් මිල ඩොලර් 2.95 කින් ඉහලට පිනුවේය. රත්රන් මිල අවුන්සයක් ඩොලර් 970.74 කට ලඟාවෙද්දී බඩඉරිඟු හා සෝයා බෝංචි මිල ද නව ඉහලකට නැඟුනි.

ලෝකයේ ප්‍රමුඛ සංචිත හා හුවමාරු මුදල වන ඩොලරයේ පිරිහීම, භාන්ඩ සමපේක්ෂනයේ තියුනු නැඟීමකට තුඩුදෙමින් අත්‍යාවශ්‍ය භාන්ඩ මිලෙහි ඉහල නැඟීමට දායක විය. වසරේ මේ දක්වා ස්වාභාවික ගෑස් මිල සියයට 26 කින් ද, ගල්අඟුරු සියයට 56 කින් ද, ප්ලැටිනම් සියයට 41 කින් ද, තිරිඟු සියයට 32 කින් හා කොකෝවා සියයට 38 කින් ද ඉහල නැඟී ඇත.

ලෝක පාරිභෝගික මිල ගනන්වල සර්පිලාකාර ඉහල නැඟීම, එක්සත් ජනපද පාරිභෝගිකයන්ට එන්ට එන්ටම පහර දෙන්නේ ඉන්ධන වියදම, නිවාස උනුසුම් කිරීම හා ආහාර මිලෙහි තියුනු ඉහල නැඟීමක ස්වභාවයෙනි. පසුගිය සතියේ එක්සත් ජනපද කම්කරු දෙපාර්තමේන්තුව වාර්තා කලේ මෙම වසරේ ජනවාරියේ පාරිභෝගික මිල දර්ශකය පසුගිය වසරට වඩා සියයට 4.3 කින් ඉහලගිය බවයි. මෙම සතියේ ආන්ඩුවේ සංඛ්‍යාලේඛන පෙන්නුම් කලේ නිෂ්පාදකයාගේ නැත්නම් තොග වෙලඳමේ එම මාසයට මිල ගනන් පසුගිය වසරට වඩා සියයට 7.4 කින් ඉහල නැඟි බවය. මෙය වසරක් පාසා නිෂ්පාදක මිල උද්ධමනයේ 1981 වසරෙන් පසු එලඹි නරකම වසර බවය.

ඉහල නඟින උද්ධමනයේ සලකුනු, ආර්ථික දර්ශක මාලාවක් මගින් ඇඟවුම් කරන දැනටමත් පවත්නා හෝ නොවැරදීම එලඹෙන පසුබෑම සමඟ සම්පාත වෙයි.

* විරැකියා දීමනා සඳහා ඉල්ලීම් පසුගිය සතියේ 19,000 කින් වැඩිවී ජනවාරි අග තිබුන මට්ටමේ ඉහලම තැනට එනම් 373,000 ට ලගා විය. ආර්ථික විද්‍යාඥයන් බලාපොරොත්තු වූයේ 4000 ක වැඩිවීමක් පමනි.

* 2007 සිව්වන කාර්තුවේ දල දේශීය නිෂ්පාදිතය (දදේනි ) ඉහල ගියේ සියයට 0.6 කින් පමනක් බව ආන්ඩුව සනාථ කලේය. 2002 න් පසු දුබලම තත්වය සලකුනු කරමින් දදේනි 2007 වසරේ වැඩිවූයේ සියයට 2.2 කින් පමනි.

* රියල්ටර්ස් ජාතික සමුලුව වාර්තා කලේ, හිමිකරුවන් විසින් කල නිවාස අලෙවිය එක දිගට පහත වැටුනු හය වන මාසය වූ ජනවාරියේ සියයට 0.4 කින් පහල ගිය බවයි. මධ්‍යම මට්ටමේ නිවාස මිල ද වැටෙන්නට පටන් ගෙන ඇති අතර එය වසරකට පෙර පැවති මට්ටමේ සිට සියයට 4.6 කින් පහත ගියේය.

ඊට වඩා වෙනස් නිවාස මිල දර්ශකයක් වන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස්- කේස් ශිලර් දර්ශකය නාගරික ප්‍රදේශ 20 ක නිවාස මිල තක්සේරුව ආවරනය කරන අතර එය වාර්තා කලේ පෙර වසරට වඩා 2007 වසරේ දෙසැම්බර් මාසයේ මිල ගනන් සියයට 9.1 කින් පහල ගිය බවයි. නිවාස මිලෙහි වාර්ෂික අනුපාතය සියයට 20 කින් පහත වැටෙනු ඇතැයි ද එය ගනන් බලයි.

* වාර්තා දෙකකින් පෙන්වන්නේ ජනවාරි මාසය තුල පාරිභෝගික විශ්වාසය තියුනු ලෙස පහත වැටුනු බවයි.

* අනෙකුත් වාර්තා පෙන්නුම් කරන්නේ පාරිභෝගික වියදම් යාන්තමින් උද්ධමනයට සමානුපාතික වන බවත් චිකාගෝ ප්‍රදේශයෙහි ව්‍යාපාරික කටයුතු තියුනු ලෙස පහත වැටී ඇති බවත්ය.

උකස්කර වෙලඳපොලෙහි බිඳවැටීමෙන් වඩ වඩාත් අලාභ වාර්තා වීමේ ප්‍රතිඵල වශයෙන් බැංකු අර්බුදයක් ඇතිවීමේ බිය කරනකොට ගෙන වෙලඳපොලවල් තව දුරටත් සසල කෙරේ. ආන්ඩුවේ වර පත්‍රයක් සහිත උකස්කර මූල්‍ය කටයුතුවල යෝධයෙකු වන ෆැනී මේ වාර්තා කලේ සිව් වන කාර්තුවේ සිය අලාභය ඩොලර් බිලියන 3.56 ක් වන බවය. ඊලග දිනයේ එහි කුඩා තරගකරුවෙකු වන ෆ්‍රෙඩී මැක් සිව් වන කාර්තුවේ සිය අලාභය බිලියන 2.5 ක් බව හා තවත් බිලියන ගනනක පාඩු අපේක්ෂා කරන බවත් වාර්තා කලේය.

එක්සත් ජනපදයේ හා යුරෝපීය බැංකු අවමුඛවලට බැඳුනු සුරැකුම් වෙලඳපොලේ කඩාවැටීමෙන් බිලියන 350 ක අතිරේක අලාභයන්ට මුහුනපා සිටින බව පෙබරවාරි 29 වන දින මූල්‍ය විශ්ලේෂකයෝ අනාවැකි පලකලහ. එදිනම ලෝකයේ විශාලතම රක්ෂන සමාගම වන ඇමරිකන් ඉන්ටනැෂනල් ගෲප්, ප්‍රධානකොටම උකස්කරයන්ට බැඳුනු ඩොලර් බිලියන 11.12 ක රක්ෂන කොන්ත්‍රාත්තු අවලංගු කිරීමේ ප්‍රතිඵල වශයෙන් සිව්වන කාර්තුවේ වර්තාගත බිලියන 5.29 ක අලාභයක් ප්‍රකාශ කලේය.

මූල්‍ය තොග විකුනාදැමීමට බලපෑ අතිරේක සාධකයක් වූයේ භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් විසින් කල ප්‍රකාශයකි. පෙබරවාරි 28 වන දින සිය මාධ්‍ය හමුවේ දී ජනාධිපති බුෂ් විසින් අනුමත කල එම ප්‍රකාශය මඟින්, වෝල් වීදියේ බැංකු හා ඩිමොක්‍රටික් මන්ත්‍රීවරුන් අතර ඇති කර ගෙන තිබෙන, උකස්කර නයට දෙන්නන්, බැංකු හා මූල්‍යායතන සතුව පවත්නා අවමුඛ හා අනෙකුත් අවිස්වාස සහගත උකස්කරයන්ට සම්බන්ධ බිලියන සංඛ්‍යාත බොල්වී ගිය ආයෝජන සඳහා අන්ඩුවේ අරමුදලක් පිහිටුවීම පිලිබඳ යෝජනා ප්‍රතික්ෂේප කරන ලදී.

© www.wsws.org